**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - 2018**

-----------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිසඳ.පාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත** | | |
| **(අ)** ප්‍රමිත අංක 02 හි 09 ඡේදයට අනුකූලව තැන්පත් නොකළ ලැබීම් රු.525,555 ක් මුදල් හා මුදල් සමාන දෑ ශේෂයෙහි නොදක්වා කාරක ප්‍රාග්ධන වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි. | විවිධ මාර්ගයන්ගෙන් ලද එහෙත් 2018 දෙසැම්බර් 31 දිනට බැංකු ගත නොකරන ලද මුදල් සහ චෙක්පත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීමේ පහසුව සඳහා, තැන්පත් නොකළ ලැබීම් ලෙස ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රමිත අංක 07 හි 14 ඡේදය අනුව වත්කම ගිණුම්ගත කිරීම එහි පිරිවැය හෝ ධාරණ අගය විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විය යුතු නමුත් කොන්ත්‍රාත් හතරක වටිනාකම රු. 15,228,514 ක් ඉංජිනේරු නිර්දේශය පමණක් පදනම් කරගෙන ප්‍රාග්ධනිත කර තිබුණි. | 2018 වර්ෂයේ ප්‍රාග්ධන වැඩ සටහන යටතේ මුදල් වෙන්වී ඇති ඉදිකිරීම් වැඩිදියුණු කිරීම් කොන්ත්‍රාත් 04 ක කටයුතු 2018 වර්ෂයේ මැද භාගයේදී ආරම්භ කරන ලදි. එහෙත් එහි කටයුතු 2018 වර්ෂය තුළ අවසන් නොවූ බැවින් අදාළ කොන්ත්‍රාත් සඳහා තවදුරටත් ගෙවිය යුතු වටිනාකම් ඉංජිනේරු නිර්දේශය පදනම්ව හඳුනාගෙන ප්‍රාග්ධනිත කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ලබා දී තිබූ රු. 8,158,986 ක මුදලින්, දරනු නොලැබූ ඉතිරි මුදල රු.1,036,804 ක් අදාළ ආයතනයට ආපසු නොගෙවා ප්‍රවර්තන වර්ෂයේ දී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි . | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා 2015 ලද මුදලින් ඉතිරිය දීර්ඝ කාලයක් යන තෙක් අදාළ දෙපාර්තමේන්තුව විමසා නොමැති බැවින් ආදායම් ලෙස ගිණුම් ගත කර ඇත. | අදාළ ආයතන වලින් වැඩිපුර ලැබී ඇති මුදල් ආදායමට නොගෙන නැවත හරවා යැවීමට පියවර ගත යුතුය. |
| (ආ) පශ්චාත් උපාධි අංශය හා භාෂා අංශය වෙත ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු.12,195,650 ක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම්වලින් කපාහැර තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | පශ්චාත් උපාධි අංශය සහ භාෂා අංශය වෙත අදාළ පාඨමාලාවට ලියාපදිංචි ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ඉතිරි මුළු පාඨමාලා ගාස්තුවම ලැබිය යුතු ආදායම් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ආදායම් ලෙස පෙන්වා ඇත. මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වූවන් අදාළ පාඨමාලා හැදෑරීම සඳහා සහභාගී වීම සිදු වී නොමැති බැවින් වටිනාකම් ගිණුම් වලින් ගලපා ඉවත් කිරීම සඳහා විශේෂ අනුමැතියක් අවශ්‍ය නොවන අතර මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | ලැබිය යුතු මුදල් කපාහැරීමේදී ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය | 779,612,380 | 786,743,302 | 7,130,922 | 2017 හා 2018 වර්ෂයන්ට අදාළ ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කළ යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂය ඉක්මවූ ලැබිය යුතු ශේෂ වටිනාකම රු.16,918,571 ක් විය. | අදහස් දක්වා නොමැත. | මෙම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂ 1ත් 5ත් අතර ගෙවිය යුතු ශේෂ වටිනාකම රු.38,310,438 ක් වූ අතර වර්ෂ 5 ක් ඉක්මවූ ශේෂය රු.4,078,959 ක් විය. | අදහස් දක්වා නොමැත. | මෙම ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

**1.7 අධිකාරී බලය නොලත් ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීමේ පනතේ දක්වා ඇති අරමුණක් නොවන සහ ආයතනයේ පුහුණු වැඩ සටහන්වලට අදාළ නොවන කාර්යක්ෂමතා කඩඉම් විභාග 78ක් ප්‍රවර්තන වර්ෂය තුළදී පවත්වා තිබුණු බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග පැවැත්වීම සඳහා 1982 දී පත්කරන ලද කමිටුව මඟින්, විභාග පැවැත්වීම සඳහා අනුමත කර ඇත. | ක්‍රියාකාරකම් අනුව පනතේ විධිවිධාන සංශෝධනයට ලක් කළ යුතු වීම. |

**1.8 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහය XV පරිච්ඡේදය 10.4 වගන්තිය හා 10.8 වගන්තිය | විදේශගත වීම සඳහා දින 10 කට පෙර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගතයුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකුගේ විදේශ ගමන් සඳහා අනුමැතිය ලබා දී නොතිබියදී ඔවුන් විදේශ විදේශගත වී තිබුණි. | ඉදිරියේදි නිසි පරිදි අනුමැතිය ලබා ගෙන නිළධාරීන්ට විදේශ ගමන් යාමට උපදෙස් ලබා දී ඇත. | විදේශගත වීමට ප්‍රථම අදාළ අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| **i.** 2015 මැයි 05 දිනැති අංක 01/2015/01 දරන චක්‍රලේඛය | විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් නවාතැන් සඳහා පමණක් පහසුකම් සපයන අවස්ථාවක ආහාරපාන සඳහා සංයුක්ත දීමනාවෙන් සියයට 35 න් 1/3 ක් පමණක් ගෙවිය යුතුයි. එසේ වුවද එයට අනුකූල නොවන ලෙස ආයතනයේ නිලධාරීන් 11 දෙනෙකු සඳහා සහ වෙනත් ආයතනවල නිලධාරීන් 166 ක් සඳහා රු. 4,115,324 ක් (ඇ.ඩොලර් 23,788) වැඩිපුර ගෙවා තිබුණි. | විදේශ ගමන් සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017 මාර්තු 17 දිනැති ලිපියෙන් රාත්‍රී ආහාරය සඳහා අදාළ සංයුක්ත දීමනාවෙන් සියයට 17 ක් ගෙවීමට අනුමැතිය දී තිබුණි. ඒ මත පදනම්ව මෙම ගෙවීම් සිදු කර ඇත. 2019 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2015/01 හි සඳහන් පරිදි සංයුක්ත දීමනාවෙන් සියයට 35 න් 1/3 ක් ගෙවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| **ii.** 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් , සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 19 කදී පාඨමාලා ගාස්තු හා වියදම් සඳහා ලබාගත් රු.794,405 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමේදී දින 10 සිට දින 209 දක්වා කාල ප්‍රමාදයන් පවතින බව දක්නට ලැබුණි. | ඉදිරියේදි අතුරු අග්‍රිම පියවීම අදාළ කාර්යය නිමකළ විගසම සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඇ)1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.56,743,886 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන අනුව ලේඛනයක් පවත්වා ගැනීම හෝ සකස්කර ඇති ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 හා 2018 වර්ෂයන්ට අදාළ ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 1.9 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ පවත්වා ගෙන යන බැංකු ගිණුම් දෙක විශ්ලේෂණය කිරීමේදී වර්ෂය පුරාම දිනපතා සාමාන්‍යයක් වශයෙන් රු.මිලියන පහකට ආසන්න ශේෂයක් පවත්වා ගන්නා බව හා වර්ෂය අවසානයේ රු.72,042,623 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ජංගම ගිණුම්වල විශාල මුදල් ප්‍රමාණයක් රඳවා තබා ගන්නවාට වඩා ඉල්ලූ විට ගෙවන තැන්පතු වල (Call Deposits) මුදල් ආයෝජනය කිරීමෙන් ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථා පිළිබඳව විචක්ෂණශීලීව සලකා බලා නොතිබුණි. | මෙම මුදල් ආයතනයේ කටයුතු වලට අදාළ දේශන ගාස්තු, උපදේශන ගාස්තු, විභාග සඳහා වන වියදම් ආදී කටයුතු වෙනුවෙන් පවත්වාගෙන යා යුතු මුදල් බව දන්වමි. වර්ෂය අවසානයේ පැවති ආයතනික ගිණුමේ ශේෂයෙන් අවශ්‍ය වියදම් දරා 2019 ජනවාරි මස රු. මිලියන 40 ක් ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර ඇත. | මුදල් ශේෂය සම්බන්ධයෙන් විචක්ෂණශීලීව කටයුතු කළ යුතු වීම. |

## 1.10 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපයන විට ගෙවිය යුතු බදු ඉපයූ මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු නමුත්, සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා අඩුකර ගෙන තිබූ රු.596,023ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | උපයන විට ගෙවිය යුතු බදු ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදයක් ඇති බව පිළිගනිමි. අදාළ බදු ඊළඟ මාසයේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | උපයන විට ගෙවිය යුතු බදු අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,428,481 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 16,040,654 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,469,135 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට උපදේශන සේවා ආදායම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

දේශන ගාස්තු ආදායම හා උපදේශන සේවා ආදායම 2017 වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 206 හා සියයට 307කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස | නිර්දේශය |
|---|---|---|
| 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතීයන අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත සියයට 50 ක ද්විතීයන දීමනාවක් ගෙවා තිබුණි. එය ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග අනුව මාසිකව ඉටුකල යුතු අවම පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ලඟාවිය යුතු බව දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| **i.** මාසික පැය 45 සීමාව වෙත ලඟා නොවුණු දේශකයින්ගේ අඩු පැය ප්‍රමාණය සඳහා වූ අයකිරීම් සිදුකළ නොහැකි වීම හේතුවෙන් ආයතනය වෙත 2018 වර්ෂයේ මුල් මාස 06 තුළ රු. 1,433,300 ක ආදායම් අහිමි වී තිබුණි | 2015 අප්‍රේල් 24 දින පැවති පාලක සභා තීරණයට අනුව 2015 ජුලි 01 වන දින සිට සෑම දේශකවරයෙක්ම මසකට දේශන පැය 45 බැගින් ආවරණය කිරීම අනිවාර්ය කර ඇති අතර, යම් දේශකවරයෙක් අදාළ මාසය තුළ සිය දේශන පැය ප්‍රමාණය ආවරණය කර නොමැති නම් මුදල් අය කර සිදු කරන පාඨමාලාවන්ගේ දේශන පැය ඒ සඳහා යොදා ගැනේ. | 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා තීරණය අනුව පැය 45ක අනිවාර්ය සේවා කාලය (වැටුප් ලබන බැවින් ) අවධාරණය කර ඇති අතර, ඒ අනුව කටයුතු නොකරන්නේ නම් මුදල් අයකරන පාඨමාලාවලින් එම මුදල් අයකර ගත යුතු වීම. |
| **ii.** ශ්‍රී ලංකා පරිපාලන සේවය වෙත 2017 වසරේදී විවෘත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් 104 දෙනෙකු සඳහා වන සේවාරම්භක පුහුණු පාඨමාලාව සඳහා කාර්ය ඇස්තමේන්තු සැකසීමේදී බාහිර දේශකවරුන්ගේ දේශන පැය 2,034 ක් සහ අභ්‍යන්තර දේශකවරුන්ගේ දේශන පැය 1,854 ක් ඇතුළත්ව දේශන පැය 3,888 සඳහා සැලසුම් සකස් කර තිබුණි. එසේ වුවද සත්‍ය වශයෙන් අභ්‍යන්තර දේශන පැය | සේවාරම්භක පුහුණු වැඩසටහන් වසරකට ආසන්න කාලයක් තුල නිලධාරීන් සියයකට වැඩි සංඛ්‍යාවක් සඳහා කණ්ඩායම් වශයෙන් ක්‍රියාත්මක කරයි. ඒ අනුව එකවර සේවාරම්භක පුහුණු වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක වනවිට සහ සේවා අවශ්‍යතාවන්ට අනුව ක්‍රියාත්මක කරන ධාරිතා වර්ධන වැඩසටහන් හා අනෙකුත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා දායක වීමට තරම් ප්‍රමාණවත් උපදේශක මහත්ම මහත්මීන් සංඛ්‍යාවක් නොමැති අතර දැනට අධ්‍යනේන්ද්‍රය | ආයතනය තුළ සිටින මානව සම්පත ප්‍රශස්ථ මට්ටමින් අභ්‍යන්තර දේශන සඳහා අනුයුක්ත කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| 1,080 ක් ද එනම් සියයට 58 ක් පමණක් හා බාහිර දේශන පැය 1,650 එනම් සියයට 81 ක් පවත්වා තිබීම හේතුවෙන් කාර්යය ඉටු කිරීමේදී බාහිර දේශකවරුන්ට ප්‍රමුඛතාව ලබාදී තිබුණු බැවින් අභ්‍යන්තර දේශකවරුන්ගේ දායකත්වය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | තුල ඇති උපදේශකවරුන් ගණනද සීමිත ප්‍රමාණයකි. | |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.69,226,520 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු. 112,780,000ක් ලැබී තිබුණි. එයින් රු.116,630,536 ක් උපයෝජනය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය නොකළ ශේෂය රු.65,375,984 ක් ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු.65,375,984 ආයතනයේ වැඩිදියුණු කිරීම් සඳහා භාවිතා කිරීමට සැලසුම් සකස් කර ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන අත රඳවාගෙන පසුව ආයෝජනය කර ඇති බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලින් ද නිරීක්ෂණය වන බැවින් ප්‍රාග්ධන ප්‍රදාන නියමිත පරිදි උපයෝජනය කළ යුතු වීම. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම හා ස්ථාවර වත්කම් සඳහා තථ්‍ය වශයෙන් උපයෝජනය කළ ප්‍රමාණය සංසන්දනය කිරීමේදී සියයට 6 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. | උද්‍යානය නඩත්තුව හා භූමි දර්ශන සැකසුම හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වූ ලංසු වටිනාකම ඇස්තමේන්තු වටිනාකමට වඩා අඩු වී තිබුණු අතර අළුත්වැඩියා හා නඩත්තු සඳහා අවශ්‍යතා පැන නැඟී නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතු බව. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 2-1 හා 1-1 දේශනශාලා ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) ගිවිසුමට අනුකූලව වැඩ නිම කළ පසු කොන්ත්‍රාත්තරු විසින් අවසන් බිල ඉදිරිපත් කර දින 14 ක් ඇතුලත ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම සහතික කළ යුතුය. අදාල සහතික කිරීම ලැබී දින 10ක් තුල ආයතනය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම සිදු කළ යුතුය. මෙම දේශන ශාලා දෙකම සම්බන්ධයෙන් ගිවිසුම් ඉහත වගන්තිවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට උපදෙස් ලබා දුනි. | ගිවිසුම්ගත පරිදි කටයුතු කළ යුතු බව. |
| (ආ) ගිවිසුමේ සඳහන් වන ආකාරයට කොන්ත්‍රාත් කාල සීමාව දින 60 ක් වූ අතර එම කාල සීමාව තුල නවීකරණ කටයුතු නිම කිරීමට ඉහත කොන්ත්‍රාත්තු දෙකෙහිම කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වී තිබුණි. | නවීකරණ කටයුතු සිදු කිරීම් අතරතුර ප්‍රමාණ පත්‍රයෙහි ඇතුළත් Provisional Sum වලට අදාළව ඉදිරිපත් කර ඇති වැඩ අයිතමයන් හා මිල ගණන් පිළිබඳව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය මගින් නිර්දේශ ලබා ගත යුතුව තිබුණි. එම ආයතනයේ නිලධාරින්ගේ රාජකාරී බහුලත්වය මත එම නිර්දේශ ලබා ගැනීම ප්‍රමාද විය. | කොන්ත්‍රාත් කාල සීමාව තුළදී ඉදිකිරීම නිම කළ යුතු බව. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය 165 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 109 ක් වීමෙන් තනතුරු 56 ක්ම පුරප්පාඩුව පැවතුනි. | අදහස් දක්වා නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. |

### 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ධාවනයේ යොදා තිබූ වාහනයක් ආයතනයට පවරා ගෙන ලියාපදිංචි කිරීම් කටයුතු කර නොතිබුණි. | KY/4331 නිසාන් X - trail ජීප් රථය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සතු වාහනයක් වන අතර මෙම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල රථය ලෙස භාවිතා කිරීමට ලබා දී ඇත. ඉදිරියේදී එම අමාත්‍යාංශයේ එකඟතාව මත වාහනය පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | වාහන අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු නමුත් 2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව විගණිත දිනය දක්වා සභාගත කර නොතිබුණි. | 2017 වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා භාර දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.2.1 අනුව වාර්ෂික අයවැයෙහි අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයද ඇතුළත් විය යුතු නමුත් ආයතනයේ වාර්ෂික අයවැය එයට අනුකූලව පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතු බව. |

| | | |
|---|---|---|
| **(ආ)** සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම තත්‍ය වියදම හා සැසඳීමේදී සියයට 13 ක සිට සියයට 130 ක් දක්වා පරාසයක විචලනයක් වූ අතර, ආදායමේ විචලනය සියයට 43 ක සිට සියයට 47 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අයවැය ප්‍රතිපාදන තත්‍ය තත්ත්වය නිවැරදි විය යුතු බව. |